# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## ජාතිය ගොඩනැගීමේ බද්ද

### 2011.06.30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් කිරීම

2011.06.30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බද්දට අදාල වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් කිරීම සඳහා වූ අවසාන දිනය

**2011.07.20**

බව ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වන තැනැත්තන් වෙත මෙයින් සිහිපත් කරනු ලැබේ.

(අ) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන (ව්‍යතිරික්ත භාණ්ඩ හැර);

(ආ) යම් සේවා සැපයීමේ ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන (ව්‍යතිරික්ත සේවා හැර); හෝ

(ඇ) තොග සහ සිල්ලර වෙළඳාමේ ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන (2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ පනත යටතේ ගැනෙන ඕනෑම භාණ්ඩයක් එකී භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින්ම අලෙවි කිරීම, ඖෂධ අලෙවි කිරීම හෝ බලයලත් තැනැත්තන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් මැණික් හෝ ස්වර්ණාභරණ අලෙවි කිරීම හැර)

සෑම තැනැත්තෙකු (තනි පුද්ගලයින්, සමාගම්, පුද්ගල මණ්ඩල) හෝ හවුල් ව්‍යාපාරයක් විසින්ම බද්දට යටත් වන පිරිවැටුමෙන් (තොග හෝ සිල්ලර වෙළඳාම සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති අදාල ගැලපීම්වලින් පසුව) 2% ක් ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස ගෙවිය යුතු වේ.

**සටහන :**

- පහත සඳහන් කොටස් බද්දට යටත් පිරිවැටුමට ඇතුලත් නොවිය යුතුය.
  - එකතුකළ අගය මත බද්ද
  - දරන ලද බොල් ණය (කෙසේ වෙතත්, මීට පෙර කපා හරින ලද, අනතුරුව අය කර ගන්නා ලද බොල් ණය සැලකිල්ලට ගත යුතුය.)
  - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත යටතේ එම කාර්තුව තුල ගෙවන ලද යම් නිෂ්පාදන බද්ද.
  - අපනයන සංවර්ධන ප්‍රතිදාන යෝජනා ක්‍රමය යටතේ ගෙවන ලද ප්‍රතිදාන.
  - අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඕනෑම ජාත්‍යාන්තර සිද්ධියකට අදාලව සපයනු ලබන ඕනෑම භාණ්ඩ හෝ සේවාවන්ගෙන් ලැබෙන පිරිවැටුම.
- ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක් (ව්‍යතිරික්ත භාණ්ඩ හැර) එකී ආනයන අවස්ථාවේදී එකතුකළ අගය මත බදු සඳහා වූ වටිනාකම මත රේගුවේදී ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ. එවැනි භාණ්ඩයක් කිසිදු නිෂ්පාදනයකට භාජනය නොකර අනතුරුව විකුණනු ලබන්නේ නම් 2011.01.01 දින හෝ එදිනට පසුව සිට එවැනි භාණ්ඩ විකිණීම තොග සහ සිල්ලර වෙළඳාමක් ලෙස ජාතිය ගොඩ නැගීමේ බද්දට යටත් වේ.
- ඕනෑම බෙදාහරින්නෙක් (ආර්ථික සේවා ගාස්තු පනතෙහි දක්වා ඇති අර්ථානුකූලව) සම්බන්ධයෙන් තොග වෙළඳාමෙන් වූ බද්දට යටත් පිරිවැටුමෙන් 75% ක් සහ අනෙකුත් තොග සහ සිල්ලර වෙළඳාමෙන් වූ බද්දට යටත් පිරිවැටුමෙන් 50% ක් අඩු කිරීමක් ලෙස බදු බැඳියාවෙන් ඉවත් කළ හැකිය. (මෙම ගැලපීමට පෙර බද්දට යටත් පිරිවැටුම කාර්තුවකට රු.500,000/- ඉක්මවන්නේ නම් බදු බැඳියාව පවතී.)

**කරුණාකර දැනටමත් ලියාපදිංචි වී නොමැති ජාතිය ගොඩ නැගීමේ බද්දට යටත් තැනැත්තන් නොපමාව ලියාපදිංචි වීමට කටයුතු කරන්න. ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය උපදෙස් සහ ආකෘති පත්‍ර ඔබට ආසන්නතම දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලයෙන් හෝ ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ ස්ථාපිත බදු සේවා අංශයෙන් හෝ 12 වෙනි මහලේ ස්ථාපිත ජාතිය ගොඩ නැගීමේ බදු අංශයෙන් ලබා ගත හැකිය.**

**ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041556 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමේ බැරට ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය.**

කරුණාකර චෙක්පතේ පිටුපස බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) සඳහන් කරන්න.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

| | | | |
|---|---|---|---|
| ජාතිය ගොඩ නැගීමේ බදු අංශය | - | දුරකථන : | 011-2338581, 011-2338721, 011-3009297, 011-3009031 |
| බදු සේවා අංශය | - | දුරකථන : | 011-2328702, 011-3009093, 011-3009257 |
| ලේකම් අංශය | - | දුරකථන : | 011-2338635, 011-2338570 |

දේශීය ආදායම් වෙබ් අඩවිය - www.inlandrevenue.gov.lk

කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.

## දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

*බදු - වඩා හොඳ අනාගතයකට*